www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# දකුනු ආසියාවේ කම්කරු පන්තියට ඉදිරි මාවත

**The road forward for the working class of South Asia**

## 2009 පෙබරවාරි 13

පෙබරවාරි 14 වන දා ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය සභා මැතිවරනය තුල සමාජවාදී සමානතා පක්ෂයේ ව්‍යායාමය දිවයිනේ පමනක් නොව මුලුමහත් දකුනු ආසියාවේ ම කම්කරු පන්තියට ඉමහත් දේශපාලන අර්ථභාරයක් දරා සිටී.

සමාජවාදී ජාත්‍යන්තරවාදය සඳහා සසපයේ අරගලය ශ්‍රී ලංකාවේ දී කර ගෙන යනු ලබන්නේ එරට ආන්ඩුව විසින් උතුරේ කර ගෙන යනු ලබන මෘග වර්ගවාදී යුද්ධයට එරෙහිව ය; යුදවාදය ද දෙමල විරෝධී ජාතෙ‍්‍යාත්තමවාදය ද අවුලා ලීමට යොමු වූ භයංකර වැඩ පිලිවෙලකට මුහුන දීගෙන ය; ගෝලීය ධනවාදයේ වත්මන් ගොරතර අර්බුදයට ප්‍රතිචාරයක් වශයෙන් ලෝකය පුරාම පැන නැගෙමින් පවත්නා වූ ආර්ථික ජාතිකවාදය සහ ආර්ථික ආරක්ෂනවාදයේ රැල්ලට එරෙහිව ය. ආන්ඩුව විසින් ප්‍රජාතන්ත්‍ර අයිතීන්ට සහ ජීවන කොන්දේසිවලට එරෙහිව නොකඩව පවත්වා ගෙන යන ප්‍රහාරයන්ට මුහුන දී ශ්‍රී ලංකා හමුදා උතුරු හා නැගෙනහිර පලාත්වලින් වහාම කොන්දේසි විරහිතව ඉවත් කර ගැනීමට සහ සකල වැඩ කරන ජනයාගේ එකමුතුව සඳහා සටන් වැදුනු එකම සංවිධානය නම් සමාජවාදී සමානතා පක්ෂය යි.

සමාජවාදී සමානතා පක්ෂයේ ව්‍යායාමය යොමු වූයේ මැතිවරන උපාමාරුවලට හෝ උප්පරවැට්ටිවලට නොවේ; එය යොමු වූයේ කම්කරු පන්තිය වෙතට ය. කම්කරු පන්තිය සිය ශක්තිය මත ම පදනම් වී ගත යුතු යයි පුත්තලමේ ධීවර ගම්මානවල ද නුවර එලියේ තේවතුවල ද ඡන්ද දායකයින්ට සසප අපේක්ෂකයෝ ඉතා ඉවසිලිවත් ව පැහැදිලි කර දුන්හ. ගොවි ජනයා කම්කරු පන්තියේ පැත්තට දිනා ගෙන සමාජවාදී පිලිවෙත් මත පදනම් වූ කම්කරුවන්ගේ සහ ගොවියන්ගේ ආන්ඩුවක් කරා මාවත කම්කරු පන්තියට විවෘත කර ගත හැක්කේ ධනේශ්වරයේ සියලුම පක්ෂයන්ගෙන් ස්වාධීනව බලමුලුගැන්වී එක්සත් වීමෙන් පමනකි.

සමාජවාදී සමානතා පක්ෂයේ ව්‍යායාමය පවත්වා ගෙන යන ලද්දේ වර්ගවාදයේ ද මර්දනයේ ද විෂඝෝර දේශපාලන වාතාවරනයක් තුල ය. ඒ වනාහී ඉතාම සීමිත ආකාරයකින් වුව ආන්ඩුවේ යුද්ධයට විරුද්ධවන්නාවූ හෝ විවේචනය කරන්නා වූ ඕනෑම කෙනෙක් ත්‍රස්තවාදීන්ගේ සහකරුවෙකු හා ජාතිද්‍රෝහියෙකු ලෙස හංවඩු ගසනු ලැබූ තත්වයකි. ගොරතර හදිසි නීති බලතල යටතේ දහස් ගනන් ජනයා හිතුවක්කාර ලෙස අත් අඩංගුවට ගෙන ඇත. තවත් සිය ගනනක් ආන්ඩුවේ අන්තේවාසික ඝාතක කල්ලි විසින් මරා දමනු ලැබ නැතහොත් අතුරුදහන් කරනු ලැබ ඇත.

මුලු දකුනු ආසියානු කලාපය හරහා වැඩෙන ආතතීන් මැද්දෑවේ සමාජවාදී සමානතා පක්ෂය ජාත්‍යන්තරවාදය සඳහා කර ගෙන යන්නාවූ අධිෂ්ඨානවත් අරගලය මුලුමහත් ඉන්දියානු උපමහාද්වීපයේ කම්කරුවන්ට තරුන ජනයාට සහ බුද්ධිමතුන්ට සුවිශේෂ වැදගත්කමක් දරයි. ශ්‍රී ලංකාවේ දිග් ගැස්සුන සිවිල් යුද්ධය වනාහී මෙම ප්‍රදේශයට දශක ගනනාවක් තිස්සේ අරක්ගෙන පවත්නා ජාති - ආගම් සහ වර්ගවාදී ප්‍රචන්ඩත්වය පිලිබඳ හුදෙක් එක් උදාහරනයක් පමනකි. 1947න් මෙපිට යුද්ධ තුනක් කර ගෙන තිබෙන, න්‍යෂ්ටික අවි ගත් ඉන්දියාව සහ පකිස්ථානය බොම්බායේ ත්‍රස්තවාදී ප්‍රහාරයෙන් ඉක්බිත්තේ උනුන් අතර සට්ටන තවතවත් වේගයෙන් උග්‍ර කර ගනිමින් සිටිති. ආර්ථික පසුගාමීත්වයේ සහ දිලිඳුභාවයේ කරවටක් ගිලී සිටින මෙම මුලුමහත් ප්‍රදේශය ම ආගමික ජනවාර්ගික, කුල හා භාෂාත්මක භේදයන් ගෙන් ගිනියම්වූ කල්දේරමක් වැන්න. එය වනාහී ධනේශ්වර සංවර්ධනය කල් පසුවූ රටවල ධනේශ්වර පන්තිය සාමාන්‍ය වැඩ කරන ජනතාවගේ ප්‍රජාතන්ත්‍ර හා සමාජ අවශ්‍යතා සපුරාලීමෙහි ලා ඓන්ද්‍රීයව ම අසමත් ය යන ලියොන් ට්‍රොට්ස්කිගේ නොනවතින විප්ලව න්‍යායෙහි මූලික ම ප්‍රවාදය ජීවමානව තහවුරු වීමකි.

දකුනු ආසියාව අරක්ගෙන තිබෙන බැලූබැල්මට විසඳිය නොහැකි වූ මේ සට්ටනයන් සියල්ලට ම හේතුභූතව පවත්නේ බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදය විසින් ප්‍රාදේශීය ධනේශ්වර ප්‍රභූවේ ආධාරයෙන් පශ්චාත් යුදකාලීන යටත්විජිත අරගලයන්ගේ ගෙල සිර කර දැමීම සඳහා පටවන ලද 1947-48 සමථය වේ. උපමහාද්වීපය මුස්ලිම් පකිස්ථානයකට ද ප්‍රධාන වශයෙන් හින්දු වූ

ඉන්දියාවකට ද බෙදා ලූ බ්‍රිතාන්‍ය යටත් විජිත මහලේකම් කාර්යාලය ලංකාවේ දේශීය ධනපති පන්තියේ නියෝජිතයන්ගේ කැහුටු සහායෙන් මෙම දිවයින මෙම ප්‍රදේශයේ බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදයේ උවමනා එපාකම් ආරක්ෂා කිරීමේ මධ්‍යස්ථානයක් ලෙස වෙන් කොට තබා ගත්තේ ය. පන්ජාබි, බෙන්ගාලී සහ දෙමල ජනයා කෘත්‍රිම ලෙස බෙදා ලූ මෙම සැලැස්ම එසැනෙන් ම මහා විනාශයක් ජනිත කලේය. ඉන්දියාව සහ පකිස්ථානය බෙදා වෙන් කිරීමෙන් අවුලුවනු ලැබූ ජනවාර්ගික කෝලාහලයෙන් දශ ලක්ෂ සංඛ්‍යාත ජනයා මරුමුවට පත්වූ හ. ශ්‍රී ලංකාවේදී අලුතින් පිහිටුවන ලද ''නිදහස්'' ආන්ඩුව ගත් ප්‍රථම පියවර වූයේ දශලක්ෂයක් දෙමල කථා කරන වතු කම්කරුවන්ට - එනම් මුලු ජනගහනයෙන් දහයෙන් පංගුවක් - පුරවැසි කම අහිමි කර ලීම ය.

ඉක්බිතිව එලඹි දශක හය තුල 1947-48 දේශපාලන තුවාල පැරී, වනවී, කුනුවී යමින් ඊනියා ජාතික අරගල අසංඛ්‍යයක් පැනනැංවිනි. මෙම සියලුම අරගල ගෙන ඇත්තේ දශක ගනනාවක් තිස්සේ තමන් භාජන කරනු ලැබූ වෙනස්කම් කිරීම හා විලෝපනයන්ට එරෙහිව පැන නැගි ලංකාවේ දෙමල ජනයාගේ යුක්ති සහගත කෝපය වෙනම ධනපති රාජ්‍ය කැබැලිත්තක් අටවා ගැනීමේ අරමුන දෙසට අවමංගත කල දෙමල ඊලම් විමුක්ති කොටි සංවිධානයේ රටාවට සමාන රටාවකි. මුල දී සීතල යුද්ධයේ රාමුව තුල සෝවියට් සංගමයේ හෝ චීනයේ ආධාරය ලබා ගැනීමේ අපේක්ෂාවෙන් එල්ටීටීඊ සංවිධානය සමාජවාදී සහ අධිරාජ්‍ය විරෝධී වර්නයක් ගත්තේ ය. සෝවියට් සංගමය බිඳ වැටීමෙන් පසු එල්ටීටීඊ සංවිධානය කලේ දෙමල ඊලම් නැමැති 'නිදහස් රාජ්‍යය' විදේශ අයෝජකයින් සඳහා ලාභ ශ්‍රම ආකරයක් බවට සකස් කර දෙන්නට පොරොන්දු වෙමින් අධිරාජ්‍යවාදී බලවතුන්ට විවෘතව ආයාචනය කිරීම ය. මෑත මාසවල දී එම සංවිධානයට අයත් වූ මිලිටරි පරාජයට අන් සියල්ලටමත් වඩා හේතු වූයේ, අවසාන විග්‍රහයේ දී අධිරාජ්‍යවාදී බලවතුන් එකෙකු හෝ අනෙකෙකුගේ සහාය දිනා ගැනීම මත සෑම විටම පදනම් වූ බංකොලොත් දේශපාලනයයි.

සමාජවාදී සමානතා පක්ෂය දකුනු ආසියාව පුරා සමාජවාදී ජාත්‍යන්තරවාදය සඳහා කර ගෙන යන්නා වූ අරගලය ඉතා ආසන්න අදාල බවක් අත්කර ගන්නේ මෙවන් තත්වයන් තුලදී ය. දකුනු ආසියාවේ ඒකාබද්ධ සමාජවාදී සමූහාන්ඩු සංගමයක් තුල ශ්‍රී ලංකාවේ හා ඊලම්හි සමාජවාදී සමූහාන්ඩුවක් සඳහා වූ සසප ක්‍රියමාර්ගය මනෝරාජික සිහිනයක් නොව කාලීන අවශ්‍යතාවයක් පිලිබඳ කරුනකි. යෝධ ජාත්‍යන්තර සංගතයන්හි සූරාකෑමට ද අධිරාජ්‍යවාදයේ මංකොල්ලකාරී කුමන්ත්‍රනයන්ට ද එරෙහිව සටන් කිරීම සඳහා කම්කරු පන්තියේ දැවැන්ත විභව ශක්තිය යොදා ගතහැක්කේ වෙන මොන ආකාරයකින් ද? මුලුමහත් දකුනු ආසියා ප්‍රදේශය පුරා සිටින්නා වූ ජාතිකවාදී ඉදිරිදර්ශනයක් මත පදනම් වූ - ස්ටැලින්වාදී සහ මාවෝවාදී කන්ඩායම් ද ඇතුලු - සියලු පක්ෂ අධිරාජ්‍යවාදී ආයෝජකයන් ද ධනේශ්වර වෙලඳපල ද මත සකල වේදනා නාශක ආශ්චර්යමත් කෝකටත් තෛලයක් ලෙස පදනම් ව සිටිති; එසේ ම ඒ හෝ මේ ආකාරයෙන් ඔවුන් සියල්ලෝ ම ඇමරිකානු අධිරාජ්‍යවාදය විසින් ඇෆ්ඝනිස්ථානය හා ඉරාකය ආක්‍රමනය කොට නව විජිතවාදී ලෙස යටත් කර ගැනීමට සහාය දී ඇත. සමාජවාදී සමානතා පක්ෂය, ඉහත සඳහන් ජාතිකවාදයේ ද දේශපාලන ප්‍රතිගාමීත්වයේ ද රලවේගයට විරුද්ධව ස්ථිරසාරව නැගී සිටීමට සමත්ව ඇත්තේ සකල වර්ගයක දේශපාලන අවස්ථාවාදයන්ට එරෙහිව හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව තුල අන්තර්ගතව පවත්නා මාක්ස්වාදී මූලධර්මයන් සඳහා දිගු කලක් තිස්සේ යෙදීගත්තා වූ දුෂ්කර අරගලය තුලිනි. 1968 විප්ලවවාදී කොමියුනිස්ට් සංගමය ලෙස ආරම්භ කල තැන් පටන් ලංකා සමසමාජ පක්ෂය ට්‍රොට්ස්කිවාදී මූලධර්ම අතහැර දමා 1964 දී සිරිමාවෝ බන්ඩාරනායක මහත්මියගේ ධනේශ්වර ආන්ඩුවට ඇතුල්වීම මගින් ජනනය කරන ලද අතිමහත් දේශපාලන ව්‍යාකූලත්වය සමග පොරබැදීමට මෙම පක්ෂයේ එවක තරුන සාමාජිකත්වයට සිදුවිය. මයිකල් පැබ්ලෝ විසින් නායකත්වය දෙන ලද වසංගත අවස්ථාවාදී ප්‍රවනතාවයේ මූලයන් හාරා විමසීමට භාජනය කලේ හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කොමිටිය සහ විප්ලවවාදී කොමියුනිස්ට් සංගමය ම පමනි. දෙවන ලෝක යුද්ධයෙන් පසුව පැන නැගුනු මයිකල් පැබ්ලෝ සහ අර්නස්ට් මැන්ඩල් විසින් නායකත්වය දෙනු ලැබූ පැබ්ලෝවාදී ප්‍රවනතාවය හතරවැනි ජාත්‍යන්තරය දිය කර හැරීමට වැඩ කටයුතු කලේය. අවුරුදු ගනනාවක් තිස්සේ ලංකා සමසමාජ පක්ෂය කර ගෙන ගිය දේශපාලනමය පසුබෑමට පැබ්ලෝවාදී එක්සත් ලේකම් මන්ඩලයේ අනුග්‍රහය ලැබුනි.

විප්ලවවාදී කොමියුනිස්ට් සංගමය 1960 ගනන් හා 1970 ගනන්වල නන්නත්තාරේ වැඩුනු සුලු ධනේශ්වර රැඩිකල් රැල්ලට එරෙහිව නැගී සිටියේ ය. සිංහල ජනතාවාදීන් ද එල්ටීටීඊයේ දෙමල බෙදුම්වාදීන් ද වෙනත් සන්නද්ධ දෙමල කල්ලි ද විසින් තෙරොම්බල් කරනු ලැබූ ''සන්නද්ධ අරගලය'' කෙරේ වහවැටීමේ එසමයේ පැවැති දේශපාලන අන්තරායන් විකොස විසින් පැහැදිලි කරන ලදී. විප්ලවවාදී කොමියුනිස්ට් සංගමයේ ආරම්භක ලේකම් කීර්ති බාලසූරිය විසින් ලියන ලද ප්‍රශස්ත ලේඛනයක් ජනතා විමුක්ති පෙරමුනේ රැඩිකල් ජාතිකවාදය විසින් ෆැසිස්ට්මය වූ සිංහල අන්තවාදයක බීජයන් දරා සිටි බවට කරන ලද අනතුරු හැඟවීම 1989 දී එම සංවිධානයේ වෙඩික්කාරයන් කම්කරුවන්ට වෘත්තීය සාංගමිකයන්ට

සහ සමාජවාදීන්ට එල්ල කල මිනීමරු ප්‍රහාරයෙන් සනාථ විය. ලංකා සමසමාජ පක්ෂයේ පාවා දීම යොදාගෙන ට්‍රොට්ස්කිවාදය අසාර්ථකවී යයි නිවේදනය කිරීමට සැරසුනු ලංකාවේ ද විදේශවල ද සියලුදෙනාට එරෙහිව විප්ලවවාදී කොමියුනිස්ට් සංගමය පහත සඳහන් දේ තහවුරු කලේය: ලංකා සමසමාජ පක්ෂයේ පරිහානිය වනාහී මාක්ස්වාදයට ආවේනික යයි ඔවුන් කියා සිටි දුබලකම්වල නිර්මානයක් නොවේ; මාක්ස්වාදය අතහැර දැමීමේ විපාකය යි.

විකොස/සසප මාක්ස්වාදී මූලධර්ම ආරක්ෂා කිරීම මගින් මුලුමහත් ධනේශ්වර දේශපාලනයේ සෑම කොටසක ම කටුක වෛරයට ලක් වී ඇත. පක්ෂය මෙම සෑම ධනේශ්වර දේශපාලන පාර්ශවයන්ගේ ම අතින් රාජ්‍ය මර්දනයට හා දේශපාලන ප්‍රචන්ඩත්වයට පාත්‍රවී තිබේ. 1971 ජනතා විමුක්ති පෙරමුනේ මදාවිය යොදා ගෙන බන්ඩාරනායක ආන්ඩුව ජවිපෙට එල්ල කල මර්දනයට විකොස විරුද්ධ වූ අතර රහසිගතව වැඩ කිරීමට විකොසට සිදු විය. එහි සාමාජිකයින් දෙදෙනෙක් රාජ්‍ය පොලිස් සිර කූඩුවේ දී මරා දමන ලදහ. 1983 දී සිවිල් යුද්ධයේ ආරම්භය සලකුනු කලා වූ දීපව්‍යාප්ත දෙමල විරෝධී විලෝපනය මැද්දැවේ දී පක්ෂය දෙමල ජනයාගේ ප්‍රජාතන්ත්‍ර අයිතීන් නිර්භීතව ආරක්ෂා කලේ ය. එහි ප්‍රතිඵලයක් ලෙස විකොස සාමාජිකයන් අත්අඩංගුවට ගන්නා ලද අතර ආන්ඩු-ගැති මැරවරයෝ පක්ෂ නායකයන්ට තර්ජන හා හිරිහැර කලහ. 1989 දී ඉන්දු-ලංකා ගිවිසුමට එරෙහිව ජවිපෙ විසින් දියත් කරන ලද ප්‍රතිගාමී ජාත්‍යොත්තමවාදී ව්‍යායාමයට විකොස විරුද්ධ විය. පක්ෂ සාමාජිකයින් තිදෙනෙක් ජවිපෙ ඝාතක කන්ඩායම් විසින් වෙඩිතබා මරනු ලැබූහ. 1998 දී සසප සාමාජිකයින් තිදෙනෙක් පක්ෂයේ සමාජවාදී ක්‍රියාමාර්ගය සඳහා සටන්වැදීමේ ''අපරාධයට'' එල්ටීටීඊය විසින් සති තුනක් තිස්සේ සිරගත කරන ලදී. ඔවුන් නිදහස් කරන ලද්දේ හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව විසින් ද ලෝක *සමාජවාදී වෙබ් අඩවිය* විසින් ද ගෙන යන ලද තියුනු ජාත්‍යන්තර ව්‍යායාමයකින් පසුව ය. මෙම සියලු ප්‍රහාරවලට ද ශ්‍රී ලංකාවේ ජාතික වාතාවරනය තුල දැඩි අතිමහත් දේශපාලන පීඩනයන්ට ද එරෙහිව නැගී සිටීමට සසපය සමත්ව ඇත්තේ ජාත්‍යන්තර කමිටුවේ අන් සියලු ශාඛාවන් මෙන් ම එය ද අප ලෝක පක්ෂයේ ඒකාග්‍රිත සංරචකයක් ලෙස එය කටයුතු කරන හෙයිනි. විකොස ආරම්භ කරන ලද්දේ ජාතික පක්ෂයක් ලෙස හෝ ජාත්‍යන්තර ෆෙඩරේෂනයක ස්වාධීන ජාතික කොටස ලෙස නොවේ. ලෝක ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරයේ සේනාංකයක් ලෙස ශ්‍රී ලංකාව තුල හා දකුනු ආසියාව තුල ලෝක සමාජවාදී විප්ලවයේ ක්‍රියාමාර්ගයට සටන් කරන්නකු හැටියට ය. *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* ආරම්භ කිරීමත් සමග සසපය දෛනික පදනමක ලෝකය පුරා තම සහෝදර පක්ෂයන් හා එක්ව ඒකාග්‍රව වැඩ කිරීමට සමත් විය. අන්තර්ජාලය ශ්‍රී ලංකාව වැනි රටකට දිලිඳු කම්කරුවන් වෙත ලංවීමට අසමත් වන්නේ යයි ප්‍රකාශ කල අයට එරෙහිව ජාත්‍යන්තර කමිටුවේ ද සසපයේ ද විශ්ලේෂනය දැන් සමස්ත දිවයිනේ ද මුලු මහත් දකුනු ආසියාවේ ද කම්කරුවන් හා තරුන ජනයා අතට තීක්ෂන ආකාරයෙන් ඇතුලු වේ. සසපයේ මැතිවරන ව්‍යායාමයේ අර්ථභාරය පවත්නේ එහි සාමාජිකයින් හෙට දින ලබාගන්නා වූ ඡන්ද සංඛ්‍යාව තුල නොවේ. පාර්ලිමේන්තු විජයග්‍රහනයන් තුලින් ඇස් නිලංකාර කර ගත් අය අවස්ථාවාදී මැතිවරන උපාමාරු පසුපස දිවීම තුලින් කම්කරු පන්තියට අත්විඳින්නට සිදු වූ ව්‍යසනයන් පිලිබඳව යලි සිතා බැලිය යුතු ය. මෙවන් ඛේදවාචක පිලිබඳව ශ්‍රී ලංකාවේ උදාහරන දුලබ නැත. සසපයේ ව්‍යායාමයේ ශක්තිය රැඳී පවතින්නේ මූලධර්මයන් සඳහා එය කර ගෙන යන්නා වූ දීර්ඝ සහ ධෛර්ය සම්පන්න අරගලය ද එහි විශ්ලේෂනයේ සහ ඉදිරි දර්ශනයේ පැහැදිලි ද භාවය නිසා ම වේ. සසප සාමාජිකයන් සමග වතුකරයට හෝ වැඩපලකට හෝ ගමකට හෝ යන්නෙකුට පැහැදිලිවන්නේ පක්ෂයේ බලපෑම එහි සාපේක්ෂකව කුඩා වූ සාමාජික සංඛ්‍යාවෙන් බොහෝ ඈතට කාවැදී ඇති බවය. දේශපාලන විරුද්ධවාදීන් අතරේ පවා එම පක්ෂය පිලිබඳව එක්තරා ගරුත්වයක් ප්‍රකාශිත වේ.

අප විශේෂයෙන් ම දකුනු ආසියාව හරහා අපගේ සියලු පාඨකයන් උනන්දු කරවන්නේ මෙම මැතිවරනයේ දී සසපය ඉදිරිපත් කර ඇති ඉදිරි දර්ශනය පරෙස්සමින් සලකා බලන ලෙස ය. ලෝක ධනවාදය 1930 ගනන්වලින් පසු ගොරතරම අර්බුදයට ඇදවැටෙන තතු තුල කම්කරු පන්තිය නියතව ම මහා ව්‍යසනයන්ට මුහුන දෙනු ඇත. සමූහ රැකියා විනාශය, භයංකර ආර්ථික දුෂ්කරතා, උග්‍ර වන ජාත්‍යන්තර ආතතීන්, ආර්ථික සට්ටන සහ අන්තිමේදී යුද්ධය යනාදී වශයෙන් කම්කරු පන්තිය මුහුන දී සිටින්නේ අතිශය තීරනාත්මක වූ දෙකින් එකකට ය. එනම්: සමාජවාදය ද ම්ලේච්ඡත්වය ද යන දෙකින් එකයි. සමාජවාදය අනාගතයක් සඳහා සටන් කරන්නට උවමනා අය ශ්‍රී ලංකාව තුල හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවට හා සමාජවාදී සමානතා පක්ෂයට ද, උප මහාද්වීපය පුරා තනන හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවට ද බැඳී ජාත්‍යන්තර විප්ලවවාදී පක්ෂය ගොඩ නැගීමට ඉදිරිපත් විය යුතුව ඇත. අත්‍යවශ්‍යවූ පෘථුල විප්ලවවාදී නායකත්වය ගොඩනැගිය හැක්කේ එමගින් පමනි.

**පීටර් සිමන්ඩ්ස්**

© www.wsws.org